# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.01.03 පැය 0600 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 12 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**01. මනුෂ්‍ය ඝාතනයක් - පන්සියගම පොලිස් වසම.**

2025.01.02 වන දින උදෑසන කාලයේ පන්සියගම පොලිස් වසමේ 07 කණුව ප්‍රදේශයේ නිවසක් තුල කාන්තාවකට තියුණු ආයුධයකින් පහරදී ඝාතනය කර ඇති බවට පන්සියගම පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 23 ක් වූ 07 කණුව, පන්සියගම ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මරණකාරිය තම ස්වාමි පුරුෂයා සමඟ ඇති වූ ආරවුලක් හේතුවෙන් මාස කිහිපයකට පෙර තම මවගේ නිවසට පැමිණ එම නිවසේ පදිංචිව සිටියදී මෙසේ ඝාතනයට ලක්ව ඇත. මරණකාරියගේ පුරුෂයා විසින් මෙම අපරාධය සිදුකර ඇති බවට පොලිසිය සැක කරනු ලබයි.

මෘත ශරීරය මහේස්ත්‍රාත් පරීක්ෂණයෙන් පසුව පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා කුරුණෑගල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා පන්සියගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. අයිස් මත්ද්‍රව්‍ය හා හෙරොයින් සමඟ සැකකාරියන් දෙදෙනෙකු හා සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - මාදම්පිටිය පොලිස් ස්ථානය.**

2025.01.02 වන දින මාදම්පිටිය පොලිස් වසමේ රන්දිය උයන ප්‍රදේශයේදී මාදම්පිටිය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරු මත වැටලීම් 04 ක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 36 මිලිග්‍රෑම් 550 ක් සමග සැකකාරියක් හා සැකකරුවන් දෙදෙනෙකුද, හෙරොයින් ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 350 ක් සමග සැකකාරියක්ද** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරියන් දෙදෙනා අවුරුදු 20 හා 31 යන වයස්වල පසුවන කොළඹ 14 හා කොළඹ 15 ප්‍රදේශවල පදිංචිකාරියන් වන අතර සැකකරුවන් අවුරුදු 25 හා 26 යන වයස්වල පසුවන කොළඹ 15 ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

මාදම්පිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. අයිස් මත්ද්‍රව්‍ය හා හෙරොයින් සමඟ සැකකාරියක් හා සැකකරුවෙකු අත්අඩංගුවට - කළුතර කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.

2025.01.02 වන දින දහවල් කාලයේ කළුතර දකුණ පොලිස් වසමේ උක්වත්ත අධිවේගී පාලම අසලදී, කළුතර කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 52 මිලිග්‍රෑම් 850 ක් හා හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 950 ක් සන්තකයේ තබාගෙන යතුරුපැදියකින් ගමන් කරමින් සිටි සැකකරුවෙකු හා සැකකාරියක් යතුරුපැදියක් සමග** අත්අඩංගුවට ගෙන කළුතර දකුණ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 33 ක් වන අතර සැකකරු වයස අවුරුදු 24 ක් වන කළුතර දකුණ ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

සැකකරු හා සැකකාරිය සංවිධානාත්මක අපරාධකරුවෙකු සමඟ සම්බන්ධ වී මත්ද්‍රව්‍ය ජාවාරම සිදුකර ඇති බවටත්, සැකකරුට කළුතර මහේස්ත්‍රාත් අධිකරණයෙන් වරෙන්තු නිකුත් වී ඇති බවටත් සිදුකරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත.

කළුතර දකුණ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මොරටුව පොලිස් ස්ථානය.

2025.01.02 වන දින රාත්‍රී කාලයේ මොරටුව පොලිස් වසමේ මුරවත්ත ප්‍රදේශයේදී මොරටුව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 100 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 34 ක් වන මොරටුවැල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මොරටුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - තලංගම පොලිස් ස්ථානය.

2025.01.02 වන දින දහවල් කාලයේදී තලංගම පොලිස් වසමේ ජයමාවත ප්‍රදේශයේදී තලංගම පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 600 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 28 ක් වන මාලඹේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

තලංගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 06. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මට්ටක්කුලිය පොලිස් ස්ථානය.

2025.01.02 වන දින රාත්‍රී කාලයේදී මට්ටක්කුලිය පොලිස් වසමේ හැඳල තොටුපල පාර ප්‍රදේශයේදී මට්ටක්කුලිය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින්

ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 310 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 39 ක් වන මට්ටක්කුලිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මට්ටක්කුලිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 07. දියේ ගිලී පුද්ගලයෙකු මියයාම - වාන්ඇල පොලිස් වසම.

2024.12.31 වන දින වාන්ඇල පොලිස් වසමේ පදිංචි පුද්ගලයෙකු මිතුරන් සමඟ සාදයකට ගොස් නැවත නිවසට නොපැමිණීම සම්බන්ධයෙන් වාන්ඇල පොලිස් ස්ථානයට සිදුකරන ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර ඇත.

2025.01.02 වන දින උදෑසන කාලයේ වාන්ඇල පොලිස් වසමේ මීගස්වැව ප්‍රදේශයේ වැවක මෘත ශරීරයක් තිබෙන බවට වාන්ඇල පොලිස් ස්ථානයට තොරතුරක් ලැබී ඇති අතර අදාල මෘත ශරීරය ඉහත පුද්ගලයාගේ බවට ඥාතීන් විසින් හඳුනාගෙන ඇත.

**මරණකරු වයස අවුරුදු 39 ක් වූ වාන්ඇල, කන්තලේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙය දියේ ගිලී සිදුවූ මරණයක් බවට දැනට සිදුකල විමර්ශනයේදී අනාවරණය වී ඇත. මෘත ශරීරය ත්‍රිකුණාමලය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර වාන්ඇල පොලිසිය වැඩිදුර විමර්ශනය සිදු කරනු ලබයි.

## 08. නාඳුනන මෘත ශරීරයක් හමුවීම - බඩල්ගම පොලිස් වසම.

2025.01.02 වන දින දහවල් කාලයේ බඩල්ගම පොලිස් වසමේ මඩම්පැල්ල කොච්චිකඩේ මාර්ගයේ කොටකන්ද ප්‍රදේශයේ වෙල් යායක පාළු ළිඳක නාඳුනන කාන්තා මෘත ශරීරයක් ඇති බවට බඩල්ගම පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 40 ත් 45 ත් අතර උස අඩි 05 අඟල් 06 ක් පමණ වේ. නිල් පැහැති කොට කලිසමක් හා නිල් පැහැති කමිසයක් හැඳ සිට ඇත.**

මෘත ශරීරය රාගම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර බඩල්ගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 09. පුරාවස්තු සෙවීමේ අරමුණින් කැණීම් කල සැකකරුවන් සිව් දෙනෙකු අත්අඩංගුවට - මැදගම පොලිස් ස්ථානය.

2025.01.02 වන දින සවස් කාලයේ මැදගම පොලිස් වසමේ හෙලඅරාව ප්‍රදේශයේ පුරාවස්තු සෙවීමේ අරමුණින් කැණීම් සිදු කරන බවට මැදගම පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත වැටලීමක් සැකකරුවන් සිව් දෙනෙකු කැණීම් කිරීම සඳහා යොදා ගත් උපකරණද සමඟින් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 18, 39, 46 හා 58 යන වයස්වල පසුවන ආණමඩුව, මැදගම හා මඩුගල්ල ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

මැදගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 10. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පනාමුර පොලිස් ස්ථානය.

2025.01.02 වන දින දහවල් කාලයේ පනාමුර පොලිස් වසමේ 07 කණුව ප්‍රදේශයේදී පනාමුර පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 57 ක් වන පනාමුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පනාමුර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 11. මාරක රිය අනතුරක් - කිලිනොච්චිය පොලිස් වසම.

2025.01.02 වන දින උදෑසන කාලයේ කිලිනොච්චිය පොලිස් වසමේ කණ්ඩාවලි ප්‍රදේශයේ ඉදිරිකරමින් පවතින පුලියම්පොක්කනේ පාලම සැකසීමට හාරන ලද ජලය පිරී ඇති වළක් තුල මෘත ශරීර දෙකක් ඇති බවට කිලිනොච්චිය පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරුවන් අවුරුදු 20 හා 23 යන වයස් වල පසු වූ නිලාවේලි ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

මරණකරුවන් පරන්තන් දෙස සිට මුලතිව් දෙසට යතුරුපැදිය ධාවනය කිරීමේදී යතුරුපැදිය පාලනය කර ගැනීමට නොහැකි වීමෙන් මෙම අනතුර සිදුව ඇති බවට දැනට සිදු කරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇති අතර එම යතුරුපැදියද දියේ ගිලී තිබියදී සොයා ගෙන ඇත.

මෘත ශරීර කිලිනොච්චිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර කිලිනොච්චිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 12. මාරක රිය අනතුරක් - මුල්ලේරියාව පොලිස් වසම.

2025.01.02 වන දින රාත්‍රී කාලයේ මුල්ලේරියාව පොලිස් වසමේ කොළඹ අවිස්සාවේල්ල මාර්ගයේ අඹතලය ප්‍රදේශයේදී කඩුවෙල දෙස සිට අංගොඩ දෙසට ධාවනය වූ යතුරුපැදියක් මාර්ගය අයිනේ නවතා තිබූ කන්ටේනර් රථයක පිටුපස ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරුපැදිකරු මුල්ලේරියාව රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 34 ක් වූ උඩුමුල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මුල්ලේරියාව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර මුල්ලේරියාව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**